# ලංකා බැංකුව

ලොව ප්‍රමුඛ පෙළේ බැංකු 1000 අතරට සහ ආසියානු ශාන්තිකර කලාපයේ විශාලතම බැංකු 500 අතරට ශ්‍රේණිගත කර ඇති, ශ්‍රී ලංකාවේ "අංක 1" රාජ්‍ය වාණිජ බැංකුව වන ලංකා බැංකුව පහත සඳහන් තනතුර සඳහා අදාළ සුදුසුකම් ඇති පළපුරුද්ද සහ කැපවීම සහිත උද්යෝගිමත් තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## අභ්‍යාසලාභී මාණ්ඩලික සහකාර

### යෝග්‍යතා නිර්ණායක

- **ශ්‍රී ලාංකීය පුරවැසියෙකු විය යුතුය**
- **සුදුසුකම්**
  - අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී මව්බස, ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව ඇතුළු විෂයයන් පහකට (5 කට) සම්මාන සාමාර්ථ සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06 කින්) (අතිරේක විෂයයන් හැර) සමත් වී තිබීම.

    සහ

  - අ.පො.ස (උ/පෙළ) විභාගයේදී විෂයයන් තුනකින් (3 කින්) (සාමාන්‍ය ඉංග්‍රීසි, සාමාන්‍ය දැනුම සහ සාමාන්‍ය තොරතුරු තාක්ෂණය හැර) එක් වරකදී සමත් වී තිබීම.
- **වෙනත් සුදුසුකම්**
  - ඉහළ මට්ටමේ අන්තර් පුද්ගල සම්බන්ධතා සහ සන්නිවේදන හැකියාව.
  - දැඩි උත්සාහය සහ කැපවීම සහිත පුද්ගලයෙකු වීම.
  - කාලානුබද්ධ ඉලක්ක අනුව සේවය කිරීමේ හැකියාව.
- **වයස**
  - අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනට වයස අවුරුදු 24 ක් හෝ ඊට අඩු විය යුතුය.

### නියමයන් හා කොන්දේසි

- පුහුණු කාලසීමාව වසර දෙකක් වන අතර මෙම පුහුණු කාලසීමාව තුළදී මාසික දීමනාවක් (පළමු වසර සඳහා මසකට රු. 45,000/- ක් ද දෙවන වසර සඳහා මසකට රු. 60,000/- ක්ද) ගෙවනු ලැබේ.
- මෙම තනතුර බැංකු සේවයේ සාමාන්‍ය නියමයන් හා කොන්දේසිවලට යටත් වන අතර සාමාන්‍ය බැංකු සේවා ධාරාවට (විවෘත සේවය) ඇතුළත් වේ.
- පුහුණු කාල සීමාව තුළ බැංකුව සෑහීමකට පත්වන ආකාරයට අවශ්‍යතා සපුරාලීම මත ස්ථිර සේවයෙහි මාණ්ඩලික සහකාර - 1 ශ්‍රේණියෙහි ස්ථිර කරනු ලැබේ.
- කාර්යාල වේලාවෙන් පසුව සහ සති අන්ත / නිවාඩු දිනවල සේවය කිරීම අපේක්ෂා කෙරේ.
- බැංකුවේ අවශ්‍යතාව මත දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් විය යුතුය.

### තෝරා ගැනීමේ පටිපාටිය

තරඟ විභාගයකින් තෝරාගනු ලබන (shortlisted) අයදුම්කරුවන් ඉන් අනතුරුව පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක් මගින්, දිස්ත්‍රික් / පළාත් අවශ්‍යතා මත පදනම්ව තෝරාගැනීම සිදු කෙරේ.

තරඟ විභාගයේදී පහත සඳහන් ප්‍රශ්න පත්‍ර සලකා බලනු ලැබේ.

ප්‍රශ්න පත්‍රය I - සාමාන්‍ය දැනීම, බුද්ධි පරීක්ෂණය සහ තොරතුරු තාක්ෂණය

ප්‍රශ්න පත්‍රය II - ඉංග්‍රීසි භාෂාව

### අයදුම් කිරීමේ පටිපාටිය

ඔබගේ අයදුම්පත අපගේ වෙබ් අඩවිය වන www.boc.lk තුළින් ("careers" තීරය හරහා) 2021 ජූලි මස 31 වන දින හෝ ඊට පෙර එවිය යුතු අතර, "අයදුම්පතෙහි යොමු අංකය" ඔබේ අනාගත පරිශීලනය සඳහා සුරැකිව තබාගන්න.

"careers" තීරයෙහි ඇති "Instructions to Candidates" හොඳින් කියවා ලබා දී ඇති උපදෙස් අනුව මාර්ගගත අයදුම්පත පුරවන්න.

***ඉහත අයදුම්කිරීමේ පටිපාටියෙන් බැහැරව වෙනත් කිසිදු ක්‍රමයකින් ලැබෙන අයදුම්පත් කිසිදු හේතුවක් නිසා භාරගනු නොලැබේ.***

***ඉහත සඳහන් අපේක්ෂිත සුදුසුකම් සපුරා නොමැති හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරන ලද ඕනෑම අයදුම්පතක් බඳවා ගැනීමේ ඕනෑම අදියරකදී කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ.***

**මානව සම්පත් අංශය,**
**ලංකා බැංකුව,**
**ප්‍රධාන කාර්යාලය, කොළඹ 01.**

***කුමන අයුරකින් හෝ බලපෑම් සිදු කිරීම වහාම නුසුදුසු බවට පත් කිරීමට හේතු වනු ඇත.***

***තෝරාගත් අයදුම්කරුවන් පමණක් කැඳවීමේ අයිතිය බැංකුව සතුය.***

ලංකා බැංකුව BOC ජාතියේ මහා පහන් ටැඹ